

වාර්ෂික කාර්යසාධන වාර්තාව 2020

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

© 2020 විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
මහලේකම් කාර්යාලය (3 වැනි මහල)
තැ.පෙ. 277
කොළඹ 00100
ශ්‍රී ලංකාව

Info@erd.gov.lk
http://www.erd.gov.lk

2020 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය 239

අන්තර්ගතය

- පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය
- පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම
- පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය
- පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක
- පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය
- පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ
- පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, විදේශ මූල්‍යයනය ඒකරාශී කිරීම පිළිබඳ වගකීම දරණ ප්‍රධානම රජයේ දෙපාර්තමේන්තුව වන අතර එය මුදල් අමාත්‍යාංශය යටතේ වන භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සහ අනෙකුත් රේඛීය අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය ඇතිව ක්‍රියාත්මක වේ.

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂ ජනරාල් ප්‍රමුඛ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් සිව්දෙනෙකු යටතේ පාලනය වේ. 2020 වසරේ දී අංශ ප්‍රධානීන් ලෙස කටයුතු කරන අධ්‍යක්ෂවරුන්ගේ අධීක්ෂණය යටතේ පහත සඳහන් අංශ හා ඒකක ක්‍රියාත්මක විය.

- ආසියානු සංවර්ධන බැංකු අංශය
- පෙරදිග ආසියානු අංශය
- ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් අංශය
- චීන හා ආසියානු යටිතල පහසුකම් හා අයෝජන බැංකු අංශය
- මැදපෙරදිග හා දකුණු ආසියානු රටවල් අංශය
- දියුණු ආර්ථික අංශය
- එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සහ තාක්ෂණික ආධාර අංශය
- ප්‍රාග්ධන වෙළඳපොළ හා ආයෝජන අංශය
- ණය කළමනාකරණ අංශය
- තොරතුරු, සම්පත් සම්බන්ධීකරණ සහ ප්‍රතිපත්ති පර්යේෂණ අධ්‍යයන අංශය
- පාලන අංශය
- ගිණුම් අංශය
- තොරතුරු තාක්ෂණ ඒකකය

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

කඩිනම් ආර්ථික සංවර්ධනයක් සඳහා අවශ්‍ය අන්තර්ජාතික දැනුම, ප්‍රවීණතාවන් සහ මූල්‍ය පහසුකම් සලසාදීම මඟින් ශ්‍රී ලංකාවේ අනාගතය හැඩගැස්වීම.

මෙහෙවර

රට තුල ණය තිරසාරත්වය දිගුකාලීනව පවත්වාගෙන යාමට උපකාරී වෙමින් ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා දරාගත හැකි පිරිවැයක් සහිතව හා අවම කොන්දේසිවලට යටත්ව විදේශ ආධාර/ මූල්‍ය පහසුකම් යෙදවීම.

අරමුණු

- සංවර්ධන ව්‍යාපෘති හිතකර කොන්දේසි හා නියමයන් මත අවම පිරිවැයකින් හා අඩු අවදානමකින් යුතුව මුල්‍යයනය කිරීමට විදේශ මූල්‍ය සම්පත් ඒකරාශි කිරීම
- විදේශ සම්පත් ඵලදායී අන්දමින් හා කාර්යක්ෂම ලෙස වැයයෝජනය කිරීමට පහසුවීම
- දිගුකාලීන විදේශ ණය තිරසාරභාවයෙන් පවත්වා ගැනීමෙහිලා දායකවීම
- විදේශ පුහුණු අවස්ථා ඵලදායී ලෙස උපයෝගී කර ගැනීම තුලින් රාජ්‍ය අංශයේ මානව සම්පත් සංවර්ධනය සඳහා දායකවීම
- දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති වගකීම් සම්භාරය ඵලදායී මෙන්ම සාර්ථක ලෙස ඉටුකිරීම උදෙසා දෙපාර්තමේන්තුවේ හැකියාවන් තවදුරටත් සවිමත් කිරීම

1.3. ප්‍රධාන කාර්යයන්

- සංවර්ධන පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වීම
- එක් එක් සංවර්ධන පාර්ශ්වකරුවන් වාර්ෂිකව ශ්‍රී ලංකා රජය වෙත ලබා දීමට නියමිත විදේශ මූල්‍යයන්ට අදාළ වැඩසටහන්වල ක්‍රියාකාරකම් රේඛීය අමාත්‍යාංශ/ආයතන හා සමඟ සම්බන්ධීකරණය කිරීම
- රේඛීය අමාත්‍යාංශ/ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ එක්ව විදේශ මූල්‍යයනය සඳහා ව්‍යාපෘති පෙළගැස්මක් පිළියෙල කිරීම
- විදේශාධාර ලබාදෙන විදේශීය දූත කණ්ඩායම් වල ක්‍රියාකාරකම් තත්ත්ව ගවේෂී අදියරේ සිට ඇගයීම් අදියර දක්වා සම්බන්ධීකරණය කිරීම
- විදේශ ආධාර පිළිබඳ සම්මුති සාකච්ඡා පැවැත්වීම හා ණය/ප්‍රදාන ගිවිසුම් අත්සන් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම සහ එම ගිවිසුම බලාත්මක කිරීම සඳහා පහත කාර්යයන් වල නිරත වීම
    - සංවර්ධන පාර්ශ්වකරුවන් හා ණය දෙනු ලබන නියෝජිතායතන සමඟ සම්මුති සාකච්ඡා පැවැත්වීම
    - ගිවිසුම් අත්සන් කිරීම සම්බන්ධයෙන් රජයේ අනුමැතිය හා අධිකාරී බලය ලබා ගැනීම්
    - ක්‍රියාත්මක නියෝජිතායතන සමඟ උප ණය ගිවිසුම් අත්සන් කිරීම
    - ණය ගිවිසුම් බලාත්මක වීමට අවශ්‍ය පූර්ව කොන්දේසි සම්පූර්ණ කිරීම
- විදේශීය ණය/ ප්‍රදාන මඟින් මුල්‍යයනය කරනු ලබන ව්‍යාපෘතින්හි ක්‍රියාකාරිත්වය සොයා බැලීම සඳහා පහත ක්‍රියාකාරකම්වල නිරත වීම

- සංවර්ධන පාර්ශ්වකරුවන්ගේ සමාලෝචන දූත කණ්ඩායම්වල කටයුතු සම්බන්ධීකරණය හා නිර්දේශිත පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම
- විදේශීය මූල්‍යයනය මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘති අධීක්ෂණය සඳහා රේඛීය අමාත්‍යාංශ මඟින් පිහිටුවා ඇති මෙහෙයුම් කමිටු සඳහා සහභාගිවීම හා සංවර්ධන පාර්ශ්වකරුවන් සමඟ එකතුව ව්‍යාපෘති ක්‍රියාත්මකවීම පිළිබඳ ප්‍රගති සමාලෝචන කටයුතු සිදු කිරීම

- තාක්ෂණික සහයෝගිතා වැඩසටහන යටතේ සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් ලැබෙන විදේශ පුහුණු අවස්ථා කළමනාකරණය කිරීම
- රජයේ විදේශීය ණය පිළිබඳ දත්ත ගබඩාව කළමනාකරණය
    - රේඛීය අමාත්‍යාංශ, භාණ්ඩාගාරය, මහ බැංකුව හා කේවල ව්‍යාපෘති කාර්යාල යනාදි ණය උපයෝජනයට අදාළ විවිධ ආයතන සඳහා විදේශ ණය හා ප්‍රදානයන්හි එකඟතා, උපයෝජනය සහ ආපසු ගෙවීම් පිළිබඳ දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම
    - විදේශීය ණය සේවාකරණය සම්බන්ධයෙන් රාජ්‍ය ණය අධිකාරී, මහ බැංකුව වෙත අවශ්‍ය තොරතුරු ලබාදීම
    - විදේශ අධාර සපයන්නන් විසින් ලබාදෙන විදේශ ආධාර හා විදේශ පුහුණු අවස්ථාවන් ප්‍රකාශයට පත්කිරීම
- සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය දේශීය බැංකු මූල්‍ය සම්පත් ඒකරාශී කිරීම
- සියලු විදේශීය මූල්‍යයන ව්‍යාපෘතිවලට අදාළව, රජයේ වාර්ෂික අයවැය සකස් කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීම

1.4. සංවිධාන සටහන


අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉඩම් බැංකුව හා ආයතනවල ඉඩම් අවශ්‍යතා සඳහා වැඩිපුර ප්‍රතිපත්ති හා ක්‍රියාත්මක කිරීම් සඳහා වගකිව යුතු)
අධ්‍යක්ෂ (ඉඩම් බැංකුව හා ආයතනවල ඉඩම් අවශ්‍යතා)
අධ්‍යක්ෂ (ඉඩම් බැංකුව හා ආයතනවල ඉඩම් අවශ්‍යතා)
අධ්‍යක්ෂ (ඉඩම් බැංකුව හා ආයතනවල ඉඩම් අවශ්‍යතා)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉඩම් බැංකුව හා ආයතනවල ඉඩම් අවශ්‍යතා සඳහා වැඩිපුර ප්‍රතිපත්ති හා ක්‍රියාත්මක කිරීම් සඳහා වගකිව යුතු)
අධ්‍යක්ෂ (ඉඩම් බැංකුව හා ආයතනවල ඉඩම් අවශ්‍යතා)
අධ්‍යක්ෂ (ඉඩම් බැංකුව හා ආයතනවල ඉඩම් අවශ්‍යතා)
අධ්‍යක්ෂ (ඉඩම් බැංකුව හා ආයතනවල ඉඩම් අවශ්‍යතා)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉඩම් බැංකුව හා ආයතනවල ඉඩම් අවශ්‍යතා සඳහා වැඩිපුර ප්‍රතිපත්ති හා ක්‍රියාත්මක කිරීම් සඳහා වගකිව යුතු)
අධ්‍යක්ෂ (ඉඩම් බැංකුව හා ආයතනවල ඉඩම් අවශ්‍යතා)
අධ්‍යක්ෂ (ඉඩම් බැංකුව හා ආයතනවල ඉඩම් අවශ්‍යතා)
අධ්‍යක්ෂ (ඉඩම් බැංකුව හා ආයතනවල ඉඩම් අවශ්‍යතා)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉඩම් බැංකුව හා ආයතනවල ඉඩම් අවශ්‍යතා සඳහා වැඩිපුර ප්‍රතිපත්ති හා ක්‍රියාත්මක කිරීම් සඳහා වගකිව යුතු)
අධ්‍යක්ෂ (ඉඩම් බැංකුව හා ආයතනවල ඉඩම් අවශ්‍යතා)
අධ්‍යක්ෂ (ඉඩම් බැංකුව හා ආයතනවල ඉඩම් අවශ්‍යතා)
අධ්‍යක්ෂ (ඉඩම් බැංකුව හා ආයතනවල ඉඩම් අවශ්‍යතා)
අධ්‍යක්ෂ (පාලන)
ස.අ. (පාලන)
ස.අ. (ව්‍යාපෘති)
මානව සම්පත් කළමනාකරණ නිලධාරී
තොරතුරු තාක්ෂණ නිලධාරී
ප.නි.
සංවිධාන මණ්ඩල - 19
රාජ්‍ය කළමනාකරණ සභකාර - 42
ප්‍රාදේශීය මට්ටමේ කාර්ය මණ්ඩලය - 31
ස.අ. - සභාපති අධ්‍යක්ෂ
ප.නි. - පරිපාලන නිලධාරී
තො. තා. නි. - තොරතුරු තාක්ෂණ නිලධාරී

02 පරිච්ඡේදය – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. හැඳින්වීම හා ඉදිරි දැක්ම

නව රජයේ උපායමාර්ගික දැක්ම, රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය වන “රට හඳන සෞභාග්‍යයේ දැක්ම” මත පදනම් වී ඇති අතර, එය ප්‍රගතිශීලී සහ සෞභාග්‍යමත් ජාතියක් නිර්මාණය කිරීමෙහිලා මුලිකවම අවධානය යොමු කරයි. එසේම රටෙහි පවතින විශාල ණය තත්ත්වය කෙරෙහි ද අවධානය යොමු කරමින් ස්ථාවර සාර්ව මූල්‍ය පරිසරයක් පවත්වාගෙන යාමද මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනය මඟින් අපේක්ෂා කරයි.

මෙම පසුබිම තුළ, සංවර්ධන ව්‍යාපෘති සඳහා විදේශ ආයෝජන වැඩිවීමත් සමඟ ණය ඌනකරණ ප්‍රවේශයක් කෙරෙහි අවධානය යොමු කරමින් රාජ්‍ය ආයෝජන පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තිය සකස් කර ඇත. ඉහත ප්‍රතිපත්ති වලට අනුකූලවෙමින්, පවතින විදේශ ණය සේවාකරණ බැඳීම්, කොවිඩ් - 19 වසංගතය හමුවේ ඇති ආර්ථික බලපෑම සහ සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය පිළිබඳව සැලකිල්ලට ගනිමින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් වර්ෂ 2020 - 2025 සඳහා රජයේ විදේශ මූල්‍යකරණ උපාය මාර්ගය සකස් කර ඇති අතර, ණය ඌනකරණ ප්‍රවේශයක් සඳහා ආරම්භයක් ලබාදීමේ අදහසින් දැනට ක්‍රියාත්මක වෙමින් පවතින සහ මාර්ගගත නව ව්‍යාපෘති විශ්ලේෂණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත.

සංවර්ධන කටයුතු සඳහා දේශීය මූල්‍යයනය වැඩි කරමින් මධ්‍ය කාලීනව සිට දිගු කාලීනව රජයේ විදේශීය වාණිජ ණය ලබාගැනීම අඩු කිරීම රජයේ ණය ගැනීමේ උපාය මාර්ගය විය. එසේම අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දුන් මඟ පෙන්වීම අනුව මාර්ගගත නව ව්‍යාපෘති පරීක්ෂාකර ඒ සඳහා නිර්දේශ ලබාදීම සඳහා වෘත්තිකයන්ගෙන් සමන්විත ව්‍යාපෘති සමාලෝචන කමිටුවක් පත් කරන ලදි. ඒ හා සමගාමීව තවදුරටත් ණය එකතුවීම වැලැක්වීම සඳහා ඇතැම් ව්‍යපෘති ණය මඟින් මූල්‍යකරණය කිරීම වෙනුවට ස්කන්ධ ප්‍රාග්ධන ආයෝජන මඟින් ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කර ඇත.

අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලැබූ ව්‍යාපෘති සමාලෝචන කමිටුව සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සැපයූ අතර, ඇතැම් ව්‍යාපෘති, එහි සංරචක සහ ක්‍රියාකාරකම්වල පවතින ගැටළු හදුනා ගැනීම සඳහා කමිටුව වෙත සහාය ලබාදෙන ලදි. තවද, භාණ්ඩාගාර ලේකම්ගේ උපදෙස් ද ඇතිව ඒ සඳහා අවශ්‍ය කරන ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලදි.

කොවිඩ් - 19 වසංගත තත්ත්වයත් සමඟ ආර්ථිකයට ඇති වී ඇති බලපෑම මත තවදුරටත් ප්‍රමුඛ නොවන ව්‍යාපෘති හඳුනාගැනීම සඳහා විදේශ මූල්‍යයන ව්‍යාපෘති කළඹ සහ තාක්ෂණික සහාය වැඩසටහන් නැවත පරීක්ෂාවට ලක්කර අදාළ සංවර්ධන පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කරන ලදි. ඉහළ දේශීය අගයක් එකතු කිරීම සඳහා ව්‍යාපෘති විෂය පථය විශ්ලේෂණය කිරීමට මෙන්ම දේශීය සම්පත් සහ දේශීය ඉදිකිරීම් කර්මාන්ත භාවිතා කිරීමට ඇති විකල්ප ගවේෂණය කිරීමට අදාළ පියවර ගන්නා ලදි.

රජයේ ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවයන්ට අනුකූල වන හඳුනාගත් ව්‍යාපෘති සීමිත සංඛ්‍යාවක් 2020 වර්ෂයේදී විදේශ සම්පත් මඟින් මූල්‍යයනය කරන ලදි. තවද ණය තිරසාරභාවය පවත්වා ගනිමින් සහ ණය නැවත ගෙවීමේදී පැහැර හැරීමකින් තොරව විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් ලබාගැනීම සඳහා ද පහසුකම් සපයන ලදි.

2.2. ප්‍රගතිය - 2020

2.2.1. විදේශ මූල්‍යයන එකඟතා

රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා අවශ්‍ය විදේශ මූල්‍යයනයන් සම්පාදනය කිරීම වෙනුවෙන් රජය විවිධ සංවර්ධන පාර්ශවකරුවන් හා ණයදෙන ආයතන සමඟ 2020 වර්ෂයේ ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා විදේශ මූල්‍යයන එකඟතා ගිවිසුම් 18 ක් මඟින් එක්සත් ජනපද ඩොලර් (ඒ.ජ.ඩො.) මිලියන 1352.0 ක එකඟතා ඇතිකර ගෙන ඇත. එය ඒ.ජ.ඩො. මිලියන 781.1 ක නිල සංවර්ධන සහාය ණය ආධාර, ඒ.ජ.ඩො. මිලියන 70.9 ක නිල සංවර්ධන සහාය ප්‍රදාන හා තාක්ෂණික ආධාර සහ චීන සංවර්ධන බැංකුව විසින් ලබාදුන් ඒ.ජ.ඩො. මිලියන 500 ක කාලීන මූල්‍ය පහසුකම් යන මුල්‍යයනයන්ගෙන් සමන්විත වේ. මෙම කාලීන මූල්‍ය පහසුකම් එක්සත් ජනපද ඩොලර් සය මාසික ලන්ඩන් අන්තර් බැංකු ඒක්ෂණ විචල්‍ය පොලී අනුපාතිකය සහ 2.51% ක ආන්තික අනුපාතයක් සහ අවුරුදු 10 ක සේවා කාලයක් සහිතව ලබාගෙන ඇත.

මෙම කාලය තුල වැඩිම නිල සංවර්ධන සහාය මූල්‍ය එකඟතා ආසියානු සංවර්ධන බැංකුව මඟින් ලබාගෙන ඇති අතර, එය ඒ.ජ.ඩො. මිලියන 568.5 කි. ඉන්පසු පිළිවෙලින් ලෝක බැංකුව (ඒ.ජ.ඩො. මිලියන 217.8), යුරෝපීය සංගමය (ඒ.ජ.ඩො. මිලියන 43.7) ජර්මනිය (ඒ.ජ.ඩො. මිලියන 12.5) ජපානය (ඒ.ජ.ඩො. මිලියන 9.5) සහ එක්සත් ජාතීන්ගේ ආයතන (ඒ.ජ.ඩො. මිලියන 0.07) මඟින් ලබාගෙන ඇත.

විදේශ මූලාශ්‍ර එකඟතා වලින් වැඩිම එකඟතා ඒ.ජ.ඩො. මිලියන 400 ක්, එනම් සමස්ථ නිල සංවර්ධන සහාය එකඟතා වලින් 31% ක් අධ්‍යාපන සහ පුහුණු අංශය වෙත ලබාගෙන ඇත. මීට අමතරව ඒ.ජ.ඩො. මිලියන 165 ක් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සහ ඒ.ජ.ඩො. මිලියන 129 ක් ආපදා කළමණාකරණය වෙනුවෙන් ලබාගෙන ඇත. මධ්‍ය කාලීනව රටෙහි ණය බර අඩුකිරීම සඳහා නව උපායමාර්ග රජය විසින් ගෙන ඇති බැවින් 2020 වසරේ සමස්ත එකඟතා පෙර වර්ෂයට සාපේක්ෂව අඩු වී ඇත.

නිල සංවර්ධන සහයෝගිතා සහ වෙළෙඳපොළ ණය එකඟතා 2020, සංවර්ධන පාර්ශ්වකරු අනුව (ඇ.ඒ.ජ.ඩො. මිලියන)

සංවර්ධන පාර්ශ්වකරු	ණය	ප්‍රදාන	එකතුව
ද්විපාර්ශ්වික නිල සංවර්ධන සහයෝගිතා	**-**	**22.0**	**22.0**
ජපානය	-	9.5	9.5
ජර්මනිය	-	12.5	12.5
බහුපාර්ශ්වික නිල සංවර්ධන සහයෝගිතා	**781.1**	**48.9**	**830.0**
ආසියානු සංවර්ධන බැංකුව	565.0	3.5	568.5
ලෝක බැංකුව	216.1	1.7	217.8
යුරෝපීය සංගමය		43.7	43.7
එක්සත් ජාතීන්ගේ සංවිධාන	-	0.07	0.07
වෙළෙඳපොළ ණය	**500.0**	**-**	**500.0**
විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම්	500.0	-	500.0
එකතුව	**1,281.1**	**70.9**	**1,352.0**

එකඟතා 2020 සංවර්ධන පාර්ශ්වකරු අනුව (එ.ජ.ඩො මිලියන)	එකඟතා 2020 ප්‍රධාන ආර්ථික අංශ අනුව (එ.ජ.ඩො මිලියන)
	
මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව	

2.2.2 විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි හා උපයෝජනය

2020 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා එ.ජ.ඩො. මිලියන 1911.7ක විදේශ ප්‍රතිලබ්ධි ප්‍රමාණයක් ලබා ගෙන ඇත. මෙයින් එ.ජ.ඩො. මිලියන 1,875.0ක් ණය ප්‍රතිලබ්ධි වන අතර එ.ජ.ඩො. මිලියන 36.7ක් ප්‍රදාන ලෙස ප්‍රතිලබ්ධි වී ඇත.

මෙම ප්‍රතිලබ්ධි වලින් ඉහළම ප්‍රමාණය චීනය සමඟ අත්සන් කරන ලද ණය ගිවිසුම් මඟින් ලබා ගත් අතර, එය සමස්තයෙන් ආසන්න වශයෙන් සියයට 45ක් ද අනතුරුව ඉහළ ප්‍රමාණයක් ලෝක බැංකුව (සියයට 17), ආසියානු සංවර්ධන බැංකුව (සියයට 16), සහ ජපානය (සියයට 9) සමඟ අත්සන් කරන ලද ණය ගිවිසුම් අනුව සිදු වූ ප්‍රතිලබ්ධි වේ.

විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි 2020, සංවර්ධන පාර්ශ්වකරු අනුව (ඇ.ඒ.ජ.ඩො. මිලියන)			
සංවර්ධන පාර්ශ්වකරු	ප්‍රතිලබ්ධි *		
	ණය	ප්‍රදාන	එකතුව
ද්විපාර්ශ්වික	**720.2**	**9.5**	**729.7**
චීනය	354.2	-	354.2
ජපානය	161.1	9.1	170.2
ප්‍රංශය	80.6	0.4	81.0
ඉන්දියාව	55.6	-	55.6
නෙදර්ලන්තය	18.8	-	18.8
චක්සත් රාජධානිය	15.6	-	15.6
කුවේටය	12.3	-	12.3
ඔස්ට්‍රියාව	8.3	-	8.3

කොරියාව	6.6	-	6.6
සෞදි අරාබිය	4.9	-	4.9
ස්පාඤ්ඤය	1.4	-	1.4
ජර්මනිය	0.5	-	0.5
ඩෙන්මාර්කය	0.3	-	0.3
බහුපාර්ශ්වික	**654.8**	**27.2**	**682.0**
ලෝක බැංකුව	320.4	1.9	322.3
ආසියානු සංවර්ධන බැංකුව	305.0	12.3	317.3
එක්සත් ජාතීන්ගේ සංවිධාන	-	13.0	13.0
ඔපෙක් අරමුදල	12.0	-	12.0
කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික අරමුදල	9.5	-	9.5
ආසියානු යටිතල පහසුකම් සංවර්ධන බැංකුව	7.9	-	7.9
වෙළඳපොල ණය	**500.0**		**500**
චීන සංවර්ධන බැංකුව	500.0		500
එකතුව	**1,875.0**	**36.7**	**1,911.7**

මූලාශ්‍රය: විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

සටහන: එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන ප්‍රතිලබ්ධි අගයයන් ඒ.ජ.ඩො හා රුපියල් බවට හැරවීමේ දී 2020 දෙසැම්බර් 31 දින පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත

** තාවකාලික*

මෙම වර්ෂයේ සිදුවූ ප්‍රතිලබ්ධි වලින් ඉහළ ප්‍රමාණයක් මාර්ග හා පාලම් අංශයේ (සියයට 26) ව්‍යාපෘතිවල උපයෝජනය පිණිස යොදවා ඇති අතර, අනතුරුව ඉහළ ප්‍රමාණයක් ජල සම්පාදනය හා සනීපාරක්ෂාව (සියයට 11), ප්‍රවාහනය (සියයට 9), සහ සෞඛ්‍යය හා සමාජ සුබසාධනය (සියයට 6) යන අංශ යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල උපයෝජනය පිණිස යොදවා ඇත.

ප්‍රතිලබ්ධි - සංවර්ධන පාර්ශ්වකරු අනුව - 2020 (ඒ.ජ.ඩො. මිලියන)



ප්‍රතිලබ්ධි 2020 - අංශ අනුව (ඒ.ජ.ඩො. මිලියන)



මූලාශ්‍රය: විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

2.2.3 පළකරන ලද එකඟතා මත ඉදිරියේ දී උපයෝජනය වීමට නියමිත ශේෂය*

දැනට පළ කර ඇති එකඟතා අනුව ඉදිරි වර්ෂ 3-5 කාලය තුළ විවිධ ව්‍යාපෘති හා වැඩසටහන්වල උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයනවල ශේෂය 2020 දෙසැම්බර් 31 දින වන විට ඒ.ජ.ඩො මිලියන 8,729.8 ක් විය.

උපයෝජනය වීමට නියමිත ශේෂය (ඒ.ජ.ඩො. මිලියන)



* *තාවකාලික*

2.2.4 විදේශ ණය ප්‍රමාණය සහ විදේශ ණය සේවාකරණය

2020 දෙසැම්බර් 31 වන විට රජය ලබාගත් විදේශ ණය මූල්‍යනයන් සඳහා ආපසු ගෙවීමට එකතු වී තිබූ විදේශ ණය ප්‍රමාණය ඒ. ජ. ඩො බිලියන 34.7[1] කි. තවද, 2020 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා සිදුකරන ලද ණය සේවාකරණය[2] ඒ.ජ.ඩො මිලියන 4,057.9කි. මෙයින්, ඒ.ජ.ඩො මිලියන 2,638.5ක් ණය ආපසු ගෙවීම සඳහා යොදවා ඇති අතර, ඉතිරිය වන ඒ.ජ.ඩො මිලියන 1,419.4ක් පොලී ගෙවීම සඳහා යොදවා ඇත.

නම: **D. A. P.** අබේසේකර

තනතුර: අධ්‍යක්ෂ ජනරාල්

අත්සන: .....

ඩී.ඒ.පී. අබේසේකර
අධ්‍යක්ෂ ජනරාල්
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය, කොළඹ 01.

[1] භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත්හි අනේවාසික අයෝජන හා *රාජ්‍ය ව්‍යාපාර සඳහා ලබාගත් ණය අඩංගු නොවේ.*

[2] මුළු ණය සේවාකරණය = පොලී ගෙවීම් + *ණය වාරික ආපසු ගෙවීම්, රාජ්‍ය ව්‍යාපාරයන්හි ණය සේවාකරණය අඩංගු නොවේ.*

3 පරිච්ඡේදය - 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූලික කාර්යසාධන ප්‍රකාශය

ඒසිඒ-එෆ්

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2020		සටහන	තත්‍ය 2020	තත්‍ය 2019	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	**ඒසිඒ-1**
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		1,253,995,076	2,451,811,040	**ඒසිඒ-3**
-	අතුරු අග්‍රිම පියවීම-මැතිවරණ දෙපාර්තමේන්තුව		30,000	-	
-	තැන්පතු		88,285	58,870	**ඒසිඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		11,214,585	9,549,076	**ඒසිඒ-5**
-	වෙනත් ලැබීම්		322,077,028	299,500,302	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**1,587,404,974**	**2,760,919,288**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ - (අ)+(ආ)**		**1,587,404,974**	**2,760,919,288**	
	අඩුකළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
98,700,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	96,550,604	94,718,990	
47,600,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	35,131,358	60,018,840	**ඒසිඒ-2(ii)**
461,900,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	325,808,839	344,062,249	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	

608,200,000	**මුළු පුනරාවර්තන වියදම් (ඈ)**		457,490,801	498,800,079	
	මූලධන වියදම්				
150,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	135,000	2,063,959	
4,100,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	3,527,109	2,521,489	
833,150,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	796,792,630	1,950,800,338	**ඒසිඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
318,250,000	හැකියා වර්ධනය	14	316,791,585	295,863,181	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
1,155,650,000	**මුළු මූලධන වියදම් (ඉ)**		1,117,246,324	2,251,248,967	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		10,202,076	12,307,974	
	තැන්පතු ගෙවීම්		88,285	58,870	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		10,113,791	12,249,104	**ඒසිඒ-5**
	මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)		1,584,939,201	2,762,357,020	
1,763,850,000	**2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඈ-උ)**		2,465,773	(1,437,732)	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පි

2020 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2020 රු.	2019 රු.
		තක්‍ය	
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	143,365,380	113,880,151
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	21,153,731	22,254,524
නොපියවූ අතුරු අග්‍රිම ගෙවීම්	ඒසිඒ-3	-	30,000
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**164,519,111**	**136,164,675**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		21,153,731	22,254,524
දේපළ පිරියත හා උපකරණ සංචිතය		143,365,380	113,880,151
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	-	-
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	30,000
මුළු වගකීම්		**164,519,111**	**136,164,675**

පිටු අංක 05 සිට 53 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 54 සිට 62 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	සහකාර අධ්‍යක්ෂ (මුදල්)
නම : එස්. ආර්. ආටිගල	නම : ඩී.ඒ.පී. අබේසේකර	නම : රෝෂිකා එන්. සමන්කුමාරි
තනතුර : ලේකම්	තනතුර : අධ්‍යක්ෂ ජනරාල්	දිනය : 2021/02/14
දිනය : 20/2/21	දිනය : 19/02/2021	
එස්. ආර්. ආටිගල මහා භාණ්ඩාගාරයේ සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම් මුදල් අමාත්‍යාංශය මහලේකම් කාර්යාලය කොළඹ 01.	**ඩී.ඒ.පී. අබේසේකර** අධ්‍යක්ෂ ජනරාල් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය මහලේකම් කාර්යාලය, කොළඹ 01.	රෝෂිකා එන් සමන්කුමාරි සහකාර අධ්‍යක්ෂ (මුදල්) විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මුදල් අමාත්‍යාංශය මහලේකම් කාර්යාලය, කොළඹ 01.

2

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

එස්ඒඑ-සී

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2020 රු.	2019 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	322,077,028	299,500,302
අතුරු අග්‍රිම ලැබීම්-මැතිවරණ දෙපාර්තමේන්තුව	30,000	
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	1,253,995,076	2,451,811,040
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,576,102,104**	**2,751,311,342**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	131,583,222	154,069,500
සහනාධාර සහ මාරුකිරීම්	325,808,839	344,062,249
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	631,311	256,241
නොපියවූ අතුරු අග්‍රිම ගෙවීම්	-	30,000
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	974,817	1,925
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**458,998,189**	**498,419,915**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**1,117,103,915**	**2,252,891,427**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
අත්තිකාරම් අයකර ගැනීම්	4,130,418	5,476,188
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**4,130,418**	**5,476,188**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	1,117,246,324	2,251,248,967
අත්තිකාරම් ගෙවීම්	3,988,009	7,118,648

ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**1,121,234,333**	**2,258,367,615**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)-(ඈ)-(ඉ)	**(1,117,103,915)**	**(2,252,891,427)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)-(ඈ) + (ඊ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	88,285	58,870
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**88,285**	**58,870**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	88,285	58,870
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**88,285**	**58,870**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)-(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2020 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන වෙතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල වෙතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2020 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 ආදායම් වකතු කිරීමෙන් කාර්යසාධනය

(රු.) ,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		වකතු කරන ලද ආදායම	
		මුදල් ඇස්තමෙන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
		අදාල නොවේ			

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

(රු.) ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	608,200	608,200	457,490.801	75.22%
ප්‍රාග්ධන	1,155,650	1,155,650	1,117,246.324	96.67%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

(රු.) ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
		අදාල නොවේ				

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

(රු.),000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2020 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්				
9152	යන්ත්‍රෝපකරණ	127,465.380	127,465.380		100%
9153	ඉඩම්				
9154	අස්පෘශ වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්	15,900	15,900		100%

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව **

විගණකාධිපති විසින් නිකුත් කරනු ලබන 2020 දෙසැම්බර් 31 වන දිනට නියමිත අවසන් විගණන වාර්තාව ඇමුණුම 01 හි අමුණා ඇත.

04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශකය ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්ය නිමැවුම		
	100% - 90%	75%-89%	50% - 74%
මූල්‍ය ඵකඟතා *	147		
මූල්‍ය උපයෝජන *	190		
තාක්ෂණික පුහුණු ** අවස්ථාවන් (නිලධාරීන් ගණන)	173		

* චීන සංවර්ධන බැංකුව විසින් ලබාදුන් ඩී.ජී.ඩෝ මිලියන 500ක විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකමද ඇතුළත් වේ

** අපේක්ෂිත තාක්ෂණික පුහුණු අවස්ථාවන් 2020 වර්ෂයේ මුල් භාගයේදී 1000ක් විය. පසුව එය මාර්තු මාසයේ මැද දී රට සහ ගුවන්තොටුපොල වසා දැමීම හේතුවෙන් අපේක්ෂිත අවස්ථා ගණන 90 දක්වා අඩු කරන ලදි.

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩුකිරීම	ඩී.ජී.ඩෝ. මිලියන 420	ප්‍රතිලාභී හෝ දායක රට සැපයුම් මාදිලිය (නිල සංවර්ධන ආධාර, ඍජු විදෙස් ආයෝජන හෝ වෙනත් සැපයුම්) අනුව සංවර්ධනය සඳහා වන සමස්ත සම්පත් ගලනය ලද ප්‍රමාණය : ඩී.ජී.ඩෝ. මිලියන 434			103
සවිමත් යටිතල පහසුකම් ගොඩනැඟීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණ ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම	ඇ.ඩී.ජී.ඩෝ. මිලියන 385	යටිතල පහසකම් සඳහා වන සමස්ත නිල ජාත්‍යන්තර සහාය (නිල සංවර්ධන ආධාර සහ වෙනත් නිල වශයෙන් ලැබෙන සැපයුම්) ලද ප්‍රමාණය : ඩී.ජී.ඩෝ. මිලියන 415			108
පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	පුහුණු අවස්ථා 90*	ක්ෂේත්‍රය සහ ඉගෙනුම් ආකාරය අනුව, ශිෂ්‍යත්ව සඳහා නිල සංවර්ධන ආධාර ගලා යාමේ ප්‍රමාණය ලැබුණු අවස්ථා ගණන - 156			173

** අපේක්ෂිත තාක්ෂණික පුහුණු අවස්ථාවන් 2020 වර්ෂයේ මුල භාගයේදී 1000ක් විය. පසුව එය මාර්තු මාසයේ මැද දී රට සහ ගුවන්තොටුපොල වසා දැමීම හේතුවෙන් අපේක්ෂිත අවස්ථා ගණන 90 දක්වා නැවත අඩු කරන ලදි*

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න

සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් වාර්ෂික විදේශ අරමුදල් ලබාදීම සිදුකරන අතර එය මුළු එකඟතා ලෙස සටහන් කර ගනී. රේඛිය අමාත්‍යාංශ මඟින් කෘෂිකර්මාන්තය, වාරිමාර්ග, නිපුණතා සංවර්ධන, අධ්‍යාපනය, දරිද්‍රතාව පිටුදැකීම, මාර්ග හා මහාමාර්ග, නාගරික සංවර්ධන හා සෞඛ්‍යය වැනි විවිධ අංශයන්හි විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මෙම එකඟ වූ අරමුදල් උපයෝජනය කරනු ලැබේ.

කෙසේ වෙතත්, පරිසර නිෂ්කාශනය, ඉඩම් අත්පත්කර ගැනීම, උපයෝගිතා සේවාවන් ප්‍රතිස්ථාපනය කිරීම, නැවත ස්ථානගත කිරීම හා නැවත පදිංචි කිරීම, තක්සේරු කිරීම හා ප්‍රසම්පාදනය වැනි ව්‍යාපෘති සූදානමට සම්බන්ධ ගැටළු හේතුවෙන් උපයෝජනයන් සැලසුම් කළ පරිදි සාක්ෂාත් කර ගත නොහැකි වේ.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	57	42	15
තෘතීයික	5	3	2
ද්විතියික	63	53	10
ප්‍රාථමික	31	27	4

6.2 **ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

විවිධ සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් විවිධ නියමයන් හා කොන්දේසි මත සහ අමාත්‍ය මණ්ඩලය, මහ බැංකුවේ මුදල් මණ්ඩලය, නීතිපති දෙපාර්තමේන්තුව සහ ජනාධිපති ලේකම් කාර්යාලය ආදියෙන් නිසි අනුමැතිය ඇතිව විදේශ සම්පත් එකරාශී කිරීම විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්යභාරයවේ.

විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සාක්ශාත් කරගැනීම සඳහා සම්මුති සාකච්ඡා පැවැත්වීමේ කුසලතා, භාෂා කුසලතා සහ ආර්ථික විද්‍යාව, රාජ්‍ය ප්‍රතිපත්ති, රාජ්‍ය මූල්‍ය, සංඛ්‍යානය, ව්‍යාපෘති සැලසුම්කරණය සහ ක්‍රියාවට නැංවීම, ණය කළමණාකරණය සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය ආදී විෂය ක්ෂේත්‍රයන්ගේ වැඩකිරීමට මනා දැනුමක් සහිත කාර්ය මණ්ඩලයක් අවශ්‍යවේ.

පුහුණුව ලත් නිළධාරීන් වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රමය හරහා වෙනත් ස්ථාන වලට මාරු කරන අතර එම පුරප්පාඩු වෙනත් ස්ථාන වලින් මාරුවීම් ලැබ පැමිණෙන නිළධාරීන්ගෙන් පුරවනු ලැබේ. මෙලෙස වාර්ෂික ස්ථාන මාරුවීම් හරහා පැමිණෙන නිළධාරීන් අතුරින් අවශ්‍ය කෙරෙන කුසලතා සහ දැනුමෙන් සමන්විත නිළධාරීන් සොයා ගැනීම ඉතා අසීරු අතර එම නිළධාරීන් පුහුණු කිරීමට දෙපාර්තමේන්තුවට

අවම වශයෙන් වසර දෙකක්වත් ගතවේ. මෙය දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යක්ෂමතාවයට බලපායි.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
1. ඕස්ට්‍රේලියාවේ ආර්ථික විද්‍යාව සහ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන		2020 ජනවාරි 01 සිට 2021 දෙසැම්බර් 31		111.6	විදේශීය	පාඨමාලාව 2021 වර්ෂය අවසානයේදී අවසන් වීමට නියමිතය.
2. වොෂිංටන් හි ලෝක බැංකු කාර්යාලය මඟින් පවත්වනු ලබන ධාරිතා සංවර්ධන වැඩසටහන		2020 ජනවාරි 03 සිට 2020 ජූලි 06		111.5	විදේශීය	ලෝක බැංකුව සම්බන්ධයෙන් වන ණය කොන්දේසි, පොළී අනුපාත, නොයෙකුත් ණය මූල්‍යන ක්‍රමවේද, පොළී පිළිබඳ විවිධ විකල්ප හා ණය උපයෝජනය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම.
3. MS Access භාවිතා කරමින් දත්ත සමුදා කළමනාකරණය		2020 පෙබරවාරි 24,25	අය කිරීම් නොමැත		දේශීය	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ වැඩි දියුණු කළ දැනුම.
4. ව්‍යාපෘති යෝජනා ලිවීමේ කුසලතා		2020 පෙබරවාරි 13,14	අය කිරීම් නොමැත		දේශීය	ව්‍යාපෘති යෝජනා ලිවීම පිළිබඳ නිලධාරීන්ගේ කුසලතා වැඩිදියුණු වීම.
5. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය, හානි පාඩු හා කපාහැරීම්		2020 පෙබරවාරි 19,20	8.5		දේශීය	භාණ්ඩ සමීක්ෂණය,හානි පාඩු හා කපාහැරීම් පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම.
6. පුද්ගලික ලිපිගොනු කළමනාකරණය		2020 සැප්තැම්බර් 14	18		දේශීය	රාජ්‍ය සේවයේ පුද්ගලික ලිපිගොනු කළමනාකරණය පිළිබඳ දැනුම ලබාගැනීම.

07 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාළ නොවේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	විගණන විමසුම්			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		

6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	විගණන හා කළමනාකරණ කමිටු			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් 2020.06.02 දිනැතිව නිකුත් කරන ලද 2020 වර්ෂය සඳහා විගණන හා කළමනාකරන කමිටු රැස්වීම් පැවැත්වීම යන ලිපියට අනුව ගෝලීය COVID – 19 වසංගතය නිසා රට තුල ඇති වූ තත්ත්වය හේතුවෙන් කාර්තුවට වැඩි බැගින් වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පැවැත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇත. ඒ අනුව 2020 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු 02ක් පවත්වා ඇත.	
8	වත්කම් කළමනාකරණය			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		

8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	කොවිඩ් - 19 තත්ත්වය හේතුවෙන් නිලධාරීන් නිතිපතා සේවයට වාර්තා නොකරන ලදි.	2021 දී සිදු කිරීමට සැලසුම් කර ඇත.
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අදාළ නොවේ		
10	බැංකු ගිණුම් කළමනාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාළ නොවේ		

10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අදාළ නොවේ		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට ඵලඹීම	අනුකූල වේ		
12	රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	පොදු තැන්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අදාළ නොවේ		
14	අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		

15	ආදායම් හිඟුම			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාළ නොවේ		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු හිඟුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාළ නොවේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	මහජනයා වෙත තොරතුරු ලබා දීම			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		

19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		